" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/PTR/21-3/FI/1(F)    ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }    දිනය / திகதி / Date } 2023.~~10~~. 11. 01

**<u>බහුකාර්ය සංවර්ධන සහායකයින් වෙත ස්ථිර පත්වීම් ප්‍රදානයට අදාළව මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ නිවේදනය - සිව්වන අදියර</u>**

බස්නාහිර පළාත් සභාවට අනුයුක්තව සේවයේ නියුතු බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් වෙත ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට අදාළව මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය **<u>2023.11.06 (සඳුදා) දින, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල ලිපිනයෙහි පිහිටා ඇති බස්නාහිර පළාත් සභා සංකීර්ණයේ 6 වන මහලේ දී පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කර ඇත.</u>**

02. ඒ අනුව, එම සම්මුඛ පරීක්ෂණය සඳහා මේ සමඟ ඇති නාම ලේඛනයෙහි නම් සඳහන් බහුකාර්ය සංවර්ධන සහායකයින් හට ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනයන් හිදී නියමිත වේලාවට 6 වන මහළෙහි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත පහත ලිපි ලේඛන ද රැගෙන සහභාගී වන ලෙස මෙයින් දන්වා සිටිමි.

- I. බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක තනතුරට පත් කරන ලද පත්වීම් ලිපියේ මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපතක්
- II. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය(DS 04)
- III. දැනට සේවයේ නියුතු බවට ආයතන ප්‍රධානියාගේ සහතිකය (ඇමුණුම 1)
- IV. උප්පැන්න සහතිකයේ මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත
- V. ජාතික හැඳුනුම්පත/ වලංගු විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය හා සහතික කරන ලද ඡායා පිටපත
- VI. NVQ 03 වන මට්ටම සම්පූර්ණ කල පුහුණු සහතිකයේ මුල් පිටපත හෝ NVQ 03 වන මට්ටම සම්පූර්ණ කරන ලද බවට සනාථ කිරීමේ ලේඛනය හා සහතික කරන ලද ඡායා පිටපත

**** (NVQ සහතිකයේ පිටපතක් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) වෙබ් අඩවියෙන් බාගත කොට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට රැගෙන ආ යුතුය.)**

- VII. වෘත්තීය සුදුසුකම් වලට අදාල සහතික වල මුල් පිටපත් හා සහතික කරන ලද ඡායා පිටපත්
- VIII. ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛන වල නමෙහි වෙනසක් ඇත්නම් එම වෙනසට අදාල දිවුරුම් ප්‍රකාශය
- IX. බස්නාහිර පළාත් සභාවේ ස්ථිර පත්වීම් ලබාගත් පසුව, අනුයුක්ත කරනු ලබන සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් සේවයේ නිරත වන බවට දිවුරුම් ප්‍රකාශය (ඇමුණුම 2)
- X. මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික 02 ක්
- XI. පිරික්සුම් ලේඛනය (ඇමුණුම 3)

03. ඉහත ලේඛන ඇමුණුම 03හි පරිදි සකස් කර ගත් පිරික්සුම් ලේඛනය මුලට සිටින පරිදි එහි සඳහන් **<u>පිළිවෙලට ලේඛනවල ඡායා පිටපත් පමණක් අමුණා රැගෙන ආ යුතුය.</u>**

[signature]

**ඩබ්ලිව්.ටී.ජ්.මානෙල්**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**
**ප්‍රධාන ලේකම් වෙනුවට**
**බස්නාහිර පළාත**